**සදාචාරාත්මක දේශපාලන සංස්කෘතියක් සඳහා කාන්තා පෙළගැස්ම/බලගැන්වීම**

රටේ පුරවැසියන් හා කාන්තාවන් ලෙසින් අපි කුමන හෝ අයුරකින් බලය අල්ලා ගැනීම හා රඳවා ගැනීමට ගන්නා වූ නිහීන උත්සහය ප්‍රසිද්ධියේ හෙලා දකිමු. අපගේ දේශපාලකයන් විශ්වාස කරන්නේ තමන්ට බලය හා මෘග ශක්තිය මගින් මිනිස් අයිතිවාසිකම් හා ප්‍රතිපත්ති මූලධර්ම පාගා දමමින් ජයගත හැකි බවයි. ඔවුන්ගේ මෙම ක්‍රියාවන් රටේ දේශපාලන හා මූල්‍යමය අස්ථාවරත්වයකට මගපාදා ඇත. මෙම අනවශ්‍ය දේශපාලන හා මූල්‍යමය අවිනිශ්චිතභාවයේ බරක් අසාධාරණ ලෙස කාන්තාවන් මත පැටවී ඇත.

මෙම දේශපාලන අර්බුදය නිර්මාණය කලවුන් තමන් කලදෑට කිසි දඬුවමක් නොලබා යෙහෙන් වැජඹෙති. ඔවුහු මෙම රටේ පුරවැසියන්ට, අඩුවශයෙන්ම කාන්තාවන්ට, තමන්ගේ වගවීමක් තිබියුතු බව විශ්වාස නොකරති.

ඔබ බලය සහිත පදවි අත්පත් කරගත්තේ දේශපාලන මැරවරකමිනි. අපි සතු ඡන්දබලය ඔබ සමච්චලයට ලක් කලේය. විධායකය මේ අයුරින් අශික්ෂිත හා අතිශයින් නින්දිත ආකාරයෙන් අපයෝජනය කිරීම සාමාන්‍යය සිදුවීමක් ලෙසින් පෙන්වීමට ගන්නා සියලුම ප්‍රයත්නයන් අපි ප්‍රතික්ෂේප කරමු. මෙය, මුදලට හෝ බලයට හුවමාරු කලනොහැකි අපේ ස්වෛරීත්වය පාවාදීමකි.

ශ්‍රී ලංකාවේ දේශපාලනයට ප්‍රචණ්ඩත්වය, වංචාව හා ජනවරම නිති පාවාදීම පිළිබඳ දිගු ඉතිහාසයක් ඇත. වත්මන් අර්බුදය එම සංස්කෘතියේ විපාකයට හොඳ නිදසුනකි.

**අපි මින් ඉදිරියට මෙය නොඉවසමු. මෙම ක්‍රියාවන් කිසිසේත් නොසලකා හැරිය නොහැක. එය සාමාන්‍ය සිදුවීමක් ලෙස තැකීම කලනොහැකිය.**

අපිට අවශ්‍යය වන්නේ ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳව පුළුල් හා විස්තීර්ණ පරමාදර්ශයකි. එයට දේශපාලන මෙන්ම ආර්ථික, සමාජයිය හා සංස්කෘතික සාධාරණත්වය හා සමානාත්මතාව ඇතුලත් වියයුතුමය. සියලු ජනවර්ගයන්ට හා අනන්‍යතා කණ්ඩායම් වලට අදාලව අරුත්බර වූ ප්‍රජාතන්ත්‍රවාදයක් වෙනුවෙන් අපි පෙනී සිටිමු. එය ස්ත්‍රී පුරුෂ සමාජභාවය, අනන්‍යතාව, දුගීබව, භූගෝලීය සාධක හෝ ජීවනෝපායන් හේතුවෙන් ආන්තික බවට පත් සියල්ලෝම ආරක්ෂා කරන ආකාරයේ ප්‍රජාතන්ත්‍රවාදයකි.

සදාචාරාත්මක දේශපාලන සංස්කෘතියක් නිර්මාණය කිරීමටත් මෙම ප්‍රචණ්ඩකාරී මැර සංස්කෘතිය බිඳහෙලීමට අපි සටන් කරන්නෙමු. දේශපාලන පදවි හා තනතුරු ඔබේ වරප්‍රසාදයවත් ජන්ම අයිතියවත් නොවේ. අපේ ඡන්දයෙන් ඔබේ දේශපාලන බලය දියුණු කරගැනීමට හෝ වාසි ලබා ගැනීමට ඔබට අයිතියක් නොමැත. අපගේ ස්වෛරීත්වය අන්දෙයකට හුවමාරු කිරීමට ඔබට අයිතියක් නැත.

කාන්තාවන් වන අපි ඔබේ ක්‍රියාවන් හෙලා දකිමු! අපි ඔබ ගැන සුපරීක්ෂාවෙන් පසුවන්නෙමු ! පුරවැසියන්ට වගවීමට අපි ඔබට බලකර සිටිමු ! ඔබේ නින්දිත ක්‍රියාවන් අපි ගර්හාවට ලක් කරන අතරම ඔබව නැවත දේශපාලන පදවියකට හෝ තනතුරකට

පත්කිරීමට ඡන්දය නොදෙන්නෙමු. ඔබ නියැලුනු නින්දිත ක්‍රියා/ අපරාධ ගැන අපි නිවසේදි, වෙළඳපලේදී හා රැකියා ස්ථානයේදී කථා කරන්නෙමු. ඔබේ තොරතුරු එළිදරවු කිරීම අපි නොනවත්වා කරන්නෙමු. නින්දාව සෙවනැල්ල සේ ඔබ පසුපසින් පැමිණීම අපි තහවුරු කරන්නෙමු.

- කාන්තා අපි සාදාචාරාත්මක දේශපාලන සංස්කෘතියක් සඳහා සටන් වදින්නෙමු
- අපගේ ඡන්දය බලයට කෑදර දේශපාලකයන්ට නොදෙන්නෙමු !
- අපි ඒකාධිපතිවාදී විධායකය ප්‍රතික්ෂේප කරමු
- බලය අල්ලාගැනීමේ දේශපාලන කුමන්ත්‍රණ අපි හෙලා දකිමු !
- සදාචාරාත්මක නොවන දේශපාලනය ඔබට සාමාන්‍යය දෙයක් වියහැකි මුත් අපිට එය එසේ නොවේ !

2018 දෙසැම්බර් 4 වැනිදා